# ගුරුවරුන් සඳහා වූ
# International Computer Driving License (ICDL) / සහ
# පරිගණක ආධාරක ඉගෙනුම (CAL)
# පරිගණක ශිෂ්‍යත්ව 5000 වැඩසටහන

ද්විතීයික අධ්‍යාපන පද්ධතිය නවීකරණය කිරීමේ මුල පියවරක් ලෙස සිසුන් සඳහා පරිගණක ආධාරක ඉගෙනුම් ක්‍රම හඳුන්වා දීම පිණිස, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තොරතුරු සහසන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳ මූලික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. එමෙන්ම මෙම පරිගණක ආධාරක ඉගෙනුම් වැඩසටහන් තුලින් හෙට ලොවට වඩා යෝග්‍ය වූ සිසුන් බිහි කිරීම උදෙසා මූලික පරිගණක හැකියාවන්ගෙන් හෙබි ගුරුවරුන් පුහුණු කිරීමට හැකි වනු ඇත.

ගුරුවරුන්ගේ පරිගණක හැකියාවන් වර්ධනය කිරීමේ බලාපොරොත්තවෙන් මෙම පරිගණක ශිෂ්‍යත්ව 5000 වැඩසටහන ක්‍රියාත්මක කරන අතර ව්‍යාපෘතිය මඟින් පරිගණක මධ්‍යස්ථාන ස්ථාපනය කර ඇති පාසල් සඳහා වැඩි අවධානයක් යොමු කරනු ඇත. දිවයින පුරා විසිරී ඇති පිළිගත් පරිගණක අධ්‍යාපන ආයතන මඟින් මෙම International Computer Driving License (ICDL) පාඨමාලාව හැදෑරිය හැකි අතර පාඨමාලාව හැදෑරීම සඳහා පූර්ණ මූල්‍යමය දායකත්වය හා පාඨමාලා අත්පොත් ව්‍යාපෘතිය මඟින් සපයනු ලබයි.

පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම International Computer Driving License (ICDL) පාඨමාලාව හැදෑරීමට වඩා යෝග්‍ය ලෙස සැලකේ.

A. 2006/01/01 දිනට වයස අවුරුදු 50 ට නො වැඩි විය යුතුය.
B. පාසලේ ද්විතීයික අංශයෙහි ( 6-13 වසර ) ඉගැන්වීම.

සැ.යු. මීට ප්‍රථම ව්‍යාපෘතියේ දායකත්වයෙන් ක්‍රියාත්මක දින 18 CAL, දින 10 GIT හා ICDL පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ ගුරුවරුන් ට මේ සඳහා ඉල්ලුම් කල නොහැකි බව කරුණාවෙන් සලකන්න.

සියළුම අයදුම් කරුවන් විදුහල්පති මඟින් තම ජීව දත්ත සටහන හා මීට ප්‍රථම දින 18 CAL දින 10 GIT හෝ ICDL පාඨමාලාව හදාරා නොමැති බව සහතික කර 2006 මැයි 20 ට පෙර එවිය යුතු අතර ඔබට වඩාත් පහසු හා ළඟම පරිගණක අධ්‍යාපන ආයතනය ද සටහන් කර පහත ලිපිනයට ඉල්ලුම් කරන්න. මෙම පාඨමාලාව පැවැත්වීමට අනුමත වූ ආයතන ලැයිස්තුව අන්තර්ජාලයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk වෙබ් අඩවිය මඟින් ලබා ගත හැක.

ලිපිනය : ව්‍යාපෘති අධ්‍යක්ෂ
ද්විතීයික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල

පරිගණක ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳ වැඩි විස්තර සඳහා දු.අ. (001) 2787059 හා විද්‍යුත් තැපැල semped@sltnet.lk භාවිතා කල හැක.

ආරියරත්න හේවගේ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල

Ministry of Education | ADB Asian Development Bank | SEMP SECONDARY EDUCATION MODERNIZATION PROJECT - II

ද්විතීයික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය - II

අධ්‍යාපන අමාත්‍යාංශය